CEYLINCO LIFE®




CEYLINCO LIFE®

ජීවිතය පුරාවට සබැඳියාවක්™

CEYLINCO LIFE®
Fortune Plus

## සෙලින්කෝ ලයිෆ් ෆෝචූන් ප්ලස්
### ධනය වර්ධනය කරන ජීවිත රැකවරණය

සෙලින්කෝ ලයිෆ් ෆෝචූන් ප්ලස් යනු, කෙටිකාලීන වාරික ගෙවීමක් තුළින් මධ්‍යකාලීන ජීවිත රක්ෂණ ප්‍රතිලාභයක් සහ ආයෝජන සැලසුමක් ලබාගත හැකි, දිගුකාලීනව වාරික ගෙවීමේ වගකීම නොමැතිව, මනා කළමනාකාරීත්වයෙන් යුතුව ආදායම් උපයන ඔබගේ ධනයට ආරක්ෂාව ලබා දෙමින් එය තවත් වර්ධනය කරන ආකර්ෂණීය ජීවිත රක්ෂණ සැලසුමකි.

ෆෝචූන් ප්ලස් වඩාත් පහසු වාර්ෂික වාරික ගෙවීම් 3ක් සහ වසර 8ක ඔප්පු කාලසීමාවක් ලබා දෙන අතර, දක්ෂ වෘත්තිකයන් හා ව්‍යවසායකයන් මෙන්ම ජීවිත රැකවරණය හා ධනය ඉපයීම සඳහා බුද්ධිමත් සැලසුම් සොයනා අය වෙනුවෙන් ඇති ගැලපෙනම ජීවිත රක්ෂණ සැලසුමයි.

## ෆෝචූන් ප්ලස් සැලැස්ම හරහා
### ඔබට පිරිනමන ප්‍රතිලාභ මොනවාද?

- **කෙටිකාලීන වාරික ගෙවීම් තුළින් මධ්‍යකාලීනව ලැබෙන ආවරණය**
  මුල් වර්ෂ 3 පමණක් වාරික ගෙවීමෙන්, වසර 8ක් පුරා ජීවිත රක්ෂණයෙන් ලැබෙන සියලුම ප්‍රතිලාභ අත්විඳින්න.

- **පරිපූර්ණ ජීවිත රැකවරණය සමඟ ධන අරමුදලක් ගොඩනගා ගැනීමට හැකි වීම**
  අපගේ ඉදිරියට නිකුත් කරන ලාභාංශ අනුපාත අනුව වසර 8 පුරාම ඔබ සැලැස්මේ ධන අරමුදලට කරන ආයෝජනය තවතවත් වර්ධනය වන අතරම, එම කාලයේ දී ඔබට ජීවිත රැකවරණය ද හිමි වේ.

- **ළබැඳි පාරිතෝෂික (Loyalty Rewards) සහිතව ධන අරමුදලෙන් ලැබෙන ආකර්ෂණීය කල්පිරීමේ ප්‍රතිලාභය**
  වර්ෂ 8 අවසානයේ දී වර්ධනය වූ කල්පිරීමේ ප්‍රතිලාභය සමගින් **සුවිශේෂී ළබැඳි පාරිතෝෂික දීමනාව ද (ඉතුරුම් කොටසේ වාර්ෂික වාරිකය මෙන් 1.2xකට සමානව)** හිමි වීමෙන් මෙම සැලසුමට ඔබ කළ ආයෝජනයෙන් උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීමට හැකි වේ.

- **කල්පිරීමේ ප්‍රතිලාභය ලබා ගත හැකි නම්‍යශීලී ක්‍රම**
  ඔබගේ මූල්‍ය අපේක්ෂාවන්ට අදාළව කල්පිරීමේ දී එක වර මුළු මුදලක් ලෙස හෝ තෝරාගත් කාලයකට මාසික ගෙවීම් ලෙස කල්පිරීමේ ප්‍රතිලාභය ලබාගත හැකියි.

CEYLINCO LIFE®
Fortune Plus

## රක්ෂණාවරණය පිළිබඳ වැඩි විස්තර

| ලක්ෂණය | විස්තර |
|---|---|
| වාරික ගෙවන කාලසීමාව | වසර 3 (වාර්ෂික වාරික පමණයි) |
| රක්ෂණ ඔප්පු කාලසීමාව | වසර 8 |
| ඇතුළත් වීමේ වයස් සීමාව | අවුරුදු 18 සිට 65 දක්වා |
| ආවරණය අවසන් වන උපරිම වයස් සීමාව | වසර 73 දක්වා |
| ජීවිත ආවරණ ප්‍රතිලාභය | සම්පූර්ණ වසර 8 සඳහා ලැබේ |
| ජීවිත රක්ෂණය සඳහා ලබා ගත යුතු අවම ආවරණය | රු. 2,000,000 ක් හෝ අරමුදලේ වාර්ෂික දායකත්වයට සමාන අගයක්, යන අගයන් දෙකෙන් වැඩි අගය. |
| ජීවිත රක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ආවරණය | සීමාවක් නොමැත |
| ධන අරමුදල ගොඩනැගීම සඳහා අවම වාර්ෂික මූලික වාරිකය (ඉතුරුම්) | රු. 500,000 |
| ළබැඳි පාරිතෝෂිකය (Loyalty Rewards) | රක්ෂණාවරණය කල්පිරීමේ දී වාර්ෂික ඉතිරි කිරීමේ වාරිකයෙන් 1.2x ක වටිනාකමක් ධන අරමුදලට නොමිලේ එකතු වේ. (ඒ සඳහා සියලුම වාරික ගෙවා කල්පිරීමේ දී රක්ෂණාවරණය සක්‍රියව තිබිය යුතු වේ.) |
| ධන අරමුදලෙන් කල්පිරීමට පෙර අර්ධ වශයෙන් මුදල් ලබාගැනීමේ ප්‍රතිලාභය | 3 වැනි ඔප්පු වර්ෂයට පසුව ඔප්පු කාලය තුළ දී වාර 2ක් (එක් වරක දී අරමුදලෙන් 10%ක උපරිමයක් දක්වා) ලබාගත හැකි ය. |
| ධන අරමුදල ටොප්-අප් (Top-up) කිරීමේ පහසුකම | වාර්ෂික වාරිකයට අමතරව, රක්ෂණ කාලසීමාවේ දී ඔබගේ අතිරේක ආදායම් ධන අරමුදලට ටොප්-අප් කිරීමෙන් ධන අරමුදලේ අගය හා වර්ධනය තවත් වැඩි කරගත හැකි ය. |
| කල්පිරීමේ ප්‍රතිලාභය ගෙවීම් ක්‍රම | මුළු මුදල එක වර ලබාගැනීම හෝ තෝරාගත් කාලයකට මාසික ගෙවීම් ලෙස ලබාගත හැකි ය. |

# ධන අරමුදලේ වර්ධනය නිදර්ශනය කිරීම

- ඔප්පු හිමියාගේ වයස - අවුරුදු 40
- රක්ෂණ ඔප්පු කාලය - වසර 8
- වාරික ගෙවන කාලසීමාව - වසර 3
- වාරිකය ගෙවන ආකාරය - වාර්ෂිකව

**ඔප්පු කාලසීමාව තුළ දී තැන්පතු මුදල් නැවත ආපසු ලබා නොගත් බවට උපකල්පනය කරමින්, ඔප්පු කාලය තුළ ආයෝජනය කළ හැකි විවිධ දායකත්ව මුදල්වලට වසර 8 අවසානයේ දී ලැබෙන නිදර්ශිත කල්පිරීමේ ප්‍රතිලාභ පහත දැක්වේ:**

| ධන අරමුදල සඳහා වාර්ෂික දායකත්වය (රු.) | ලබාගත යුතු අවම ජීවිත ආවරණය | මුළු වාර්ෂික වාරිකය (ධන අරමුදල + ජීවිත ආවරණය) | වසර 3 සඳහා මුළු ආයෝජනය | වසර 8 අවසානයේ කල්පිරීමේ ප්‍රතිලාභය නිදර්ශනයක් ලෙස* | | |
|---|---|---|---|---|---|---|
| | | | | 6% | 8% | 10% |
| 500,000 | 2,000,000 | 529,740 | 1,589,220 | 2,118,836 | 2,325,559 | 2,556,191 |
| 1,000,000 | 2,000,000 | 1,029,740 | 3,089,220 | 4,241,929 | 4,655,697 | 5,117,309 |
| 2,000,000 | 2,000,000 | 2,029,740 | 6,089,220 | 8,488,114 | 9,315,971 | 10,239,546 |

* මෙය කල්පිරීමේ ප්‍රතිලාභ පිළිබඳ නිදර්ශනයක් පමණයි. සමාගම විසින් මාසිකව ප්‍රකාශ කරන ලාභාංශ අනුපාත, වාරික ගෙවීමේ දිනයන් සහ ඔප්පු කාලසීමාවේ දී ඔප්පු හිමියා අරමුදලෙන් සිදු කරන මුදල් ආපසු ගැනීම් අනුව, ඔප්පු හිමියාට සැබැවින්ම හිමි කල්පිරීමේ ප්‍රතිලාභයේ අගය වෙනස් විය හැකි ය.

* මෙහි දැක්වෙන 6%, 8% සහ 10% අනුපාතයන් යනු අරමුදල් කළමනාකරණ ගාස්තුව අඩු කිරීමට පෙර ලැබෙන, උපයාගත් අනුපාතයන් **(Earned Rates)** වේ.

* ඔප්පු හිමියාගේ වයස සහ සෞඛ්‍ය තත්ත්වය අනුව වාරිකයේ අගය වෙනස් වේ.

**'Fortune Plus' ඔබගේ අනාගතයට වාසනාව ගෙනෙන අයුරු පිළිබඳ වැඩි විස්තර දැනගන්න, (011) 2 461 461 අමතන්න.**

නැතිනම්, ඔබේ විශ්වසනීය සෙලින්කෝ ලයිෆ් ජීවිත රක්ෂණ උපදේශකට අදම කතා කරන්න.

මෙම අත්පත්‍රිකාව දැනුවත් කිරීම සඳහා පමණක් වන අතර මෙය රක්ෂණ ගිවිසුමක් නොවේ. ප්‍රතිලාභ, බැහැර කිරීම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනය සැලකිල්ලෙන් කියවා වටහාගන්න.

*කොන්දේසි අදාළ වේ

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මඟින් බලපත්‍ර ලබා දී ඇත.



CEYLINCO LIFE®

ජීවිතය පුරාවට සබැඳියාවක්™

සෙලින්කෝ ලයිෆ් රක්ෂණ සමාගම, සෙලින්කෝ ලයිෆ් ටවර්, 106, හැව්ලොක් පාර, කොළඹ 05. සමාගම් ලියාපදිංචි අංකය PB5183 දුරකතනය: (011) 2 461 461 ඊමේල්: service@ceylife.lk වෙබ් අඩවිය: www.ceylincolife.com

CEYLINCO LIFE®






CEYLINCO LIFE®

ජීවිතය පුරාවට සබැඳියාවක්™